# CHARACTERIZATION FROM ROMAN MYTHOLOGY: BASED ON "YAVANA PURANA"

H.M.S.I. Kumari[1] and R.M.C. Ranasinghe[2]


## Abstract

Identifying a clear distinction between folktales, legends and myths is difficult. The ancient society's beliefs were fundamental to the creation of such stories. Unlike today, the people of that time spent their lives abundantly in harmony with the environment. There are many occasions when ancient man became curious about various phenomena arising from the environment. Ancient people hypothesized that there was something power behind such events in the environment. This naturally led to the emergence of myths, giving a supernatural power to various emotional states and various stages, experiences, and activities of human life. This influence on the poet carried over to the creation of epic poetry. "Ovid's Metamorphoses" is one such epic literary work. The primary purpose of this study is to study the human characteristics of Roman myths. To achieve that purpose, Deegoda Piyadasa's "Yavana Puranaya" is a Sinhalese adaptation of "Ovid's Metamorphoses" is used as the secondary data source. The research method is a qualitative study method that belongs to the anthropological research method. What kind of characters are shown in myths? Are they all-time facts? Are the research problems here? Ovid visualizes the strength and depth of human relationships through different characters, as well as in love, separation, disagreement, blindness and brutality. The book led Ronald Seth to call 'Ovid' a 'psychologist' and it is clear that the myths of "Metamorphoses" have also influenced psychoanalyst Freud's 'ego complex' and 'narcissism complex'. From this it can be concluded that even though the person physically changes with the ages, the moods highlight common characteristics for the past as well as the present and the future through myths. "Metamorphoses" is one of the strongest pieces of literature that bears witness to it.


**Keywords:** Epic Poems, Human Moods, Myths, Poet

[1] Temporary Lecturer, Department of Sinhala, University of Kelaniya

Email: sachinthiisuri2@gmail.com https://orcid.org/0009-0002-1286-1003

[2]Lecturer, Department of Sinhala, University of Kelaniya

Email: chinthakar@kln.ac.lk https://orcid.org/0009-0001-8646-6674

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# රෝම පුරාකතාවන්ගෙන් නිරූපිත චරිත නිරූපණය : යවන පුරාණය නම් අනුවාදය ඇසුරෙන්


**සාරසංක්ෂේපය**

ජනකතා, ජනප්‍රවාද සහ මිථ්‍යාකතා අතර පැහැදිලි වෙනසක් හඳුනාගැනීම අපහසුය. එවැනි කතා නිර්මාණය වීමට ඉපැරණි සමාජයේ පැවති විශ්වාසයන් මූලික විය. අද මෙන් නොව ඉපැරණි මිනිසා සිය දිවිය ගෙවූයේ පරිසරය සමඟ ඒකාත්මිකවය. යම් අවස්ථාවල දී පරිසරයෙන් පැනනඟින විවිධ සංසිද්ධීන් කෙරෙහි ආදි මිනිසා කුතුහලයට පත් වූ අවස්ථා අප්‍රමාණය. පරිසරයේ සිදුවන මෙවැනි සිදුවීම්වල යම්කිසි සැඟවුණු බලවේගයක් ඇති බවට ඔවුන් උපකල්පනය කළහ. මිනිස් දිවියේ ඇතිවන විවිධ අවධීන්, අත්දැකීම්, විවිධ චිත්තවේගීය අවධීන් සහ ක්‍රියාකාරකම් කෙරෙහි අධිස්වාභාවික බලයක් ලබාදීම; මිථ්‍යාවන් නිරායාසයෙන් ඇතිවීමට හේතු විය. පසුකාලීන ව කවියා කෙරෙහි වූ බලපෑම වීර කාව්‍ය නිර්මාණකරණය දක්වා ගෙන ගියේය. "ඔවිඩ්ගේ Metamorphoses" නම් කෘතිය එවැනි වීර කාව්‍ය සාහිත්‍ය කෘතියක් ලෙස සැළකිය හැකිය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ රෝම මිථ්‍යාවන්හි මානව චරිත ලක්ෂණ අධ්‍යයනය කිරීමයි. එම අරමුණ පූරණය කරගැනීම සඳහා ද්විතීයික දත්ත මූලාශ්‍රය ලෙස "ඔවිඩ්ගේ Metamorphoses" නම් කෘතියට සපයා ඇති සිංහල අනුවර්තනයක් වන දීගොඩ පියදාසයන් විසින් රචනා කරන ලද යවන පුරාණය නම් කෘතිය උපයෝගී කරගැනේ. මානවවංශ පර්යේෂණ ක්‍රමවේදයට අයත් ගුණාත්මක අධ්‍යයන ක්‍රමවේදය අධ්‍යයන ක්‍රමවේදය වේ. මිථ්‍යාකතාවන්හි දැක්වෙන්නේ කුමන ආකාරයේ චරිත ද? එම චරිත සර්වකාලීන වේ ද? යන්න මෙහි පර්යේෂණ ගැටලු වේ. ඔවිඩ් විවිධ චරිත ඔස්සේ ආදරය, විරහව, අසම්මතය, අන්ධානුකරණය හා ම්ලේච්ඡත්වය තුළින් මානව සබඳතාවන්හි හා මානව චිත්ත චෛතසිකයන්ගේ පෘථුල බව දෘශ්‍යමාන කරයි. මෙම කෘතිය රොනල්ඩ් සෙත්ට "ඔවිඩ්" මනෝවිද්‍යාඥයෙකු ලෙස හැඳින්වීමට තුඩු දුන් අතර " Metamorphoses"හි ඇතුළත් මිථ්‍යාකතා මනෝවිශ්ලේෂක ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ "ඊගෝ සංකීර්ණය" සහ "නාසිසස් සංකීර්ණය" කෙරෙහිද බලපෑම් කර ඇති බව පැහැදිළිය. කාලානුරූපීව පුද්ගලයා වෙනස් වුවද මනෝභාවයන් අතීතයට මෙන්ම වර්තමානයට සහ අනාගතයටත් පොදු ලක්ෂණ රෝම මිථ්‍යාකතා මඟින් ඉස්මතු කරන බව මින් නිගමනය කළ හැකිය. ඒ සඳහා "Metamorphoses"හි සිංහල අනුවර්තනය වන "යවන පුරාණය" ද වැදගත් සාහිත්‍ය කෘතියක් ලෙස සැළකිය හැකිය.


**ප්‍රමුඛ පද** : කවියා, චිත්ත චෛතසිකයන්, වීර කාව්‍ය, මානව, මිථ්‍යාකතා

## හැඳින්වීම

ග්‍රීක මහා කවි හෝමර්ගේ මහා කාව්‍ය ද්විත්වය වන ඉලියඩ් හා ඔඩිසි යන කෘති හා රෝම මහා කාව්‍යන් ලෙස විද්වත් අවධානයට යොමුවන වර්ජිල්ගේ ඊනිඩයත්, ඔවිඩ්ගේ "Metamorphoses" නම් අග්‍රගණ්‍ය කෘතියත් පුරාණෝක්ති ඔස්සේ නිර්මිත කාව්‍යයන් වශයෙන් සැලකීමට බඳුන් වේ. මෙය පෙරදිගවාසීන් හට විශ්මයට කරුණක් නොවේ. අසල්වැසි භාරතීය දේශයේ මෙන්ම මෙරටත් මහා කාව්‍යයන් නිර්මාණය වී ඇත්තේ පුරාණෝක්ති ආශ්‍රයෙන් වීම මීට හේතුවයි. ඉපැරණි යුගය තුළ කාව්‍යයක් ගෙතීමෙහිලා එම සමාජය, ආගමික විශ්වාස, දේශපාලනික හා ආර්ථික රටාව ද වර්තමානයේ මෙන්ම බලපෑ බවට සාධක ඉහත කෘතිවලින් ධ්වනිතය. ඉලියඩ් හා ඔඩිසි නම් පුරාකතා ක්‍රි.පූ. හත්වන හෝ අටවන ශතවර්ෂවල දී පමණ රචනා කර ඇති බව විද්වත් මතයයි. (Wells, 1965). වර්ජිල් ඉතාලියෙහි ක්‍රි.පූ. හැත්තෑවත්, ක්‍රි.ව. දහ නවයත් අතර ජීවත්ව සිටි බවට සාධක වන හෙයින් ඊනිඩ් නම් මහා කාව්‍යය එම කාලවකවානුව අතර නිර්මාණය කර ඇති කාව්‍යයක් ලෙස සැලකීම නුසුදුසු නොවේ. (සේනානායක, 2009). ක්‍රි.ව. හතලිස් තුනේ දී ඔවිඩ්ගේ උපත රෝමයට සැතපුම් අනූවක් පමණ නැගෙනහිරින් පිහිටි සුල්මෝවේ සිදු වූ බව පිළිගැනෙන අතර ක්‍රි.ව. නව වැන්නේ සිට ජීවිතාන්තය දක්වා එනම් ක්‍රි.ව. දාහත වන තෙක් තවමත් සොයාගැනීමට නොහැකි වූ වරදක් හේතුවෙන් ඔහුව පිටුවහල් කිරීමෙන් අනතුරුව කළු මුහුද අසල ටෝමියෙහි ජීවත් වූ බව සඳහන් වේ. (පියදාස, 1959). එබැවින් ඔවිඩ්ගේ "Metamorphoses" නම් පුරාකතා මාලාව ද ක්‍රි.පූ. හතලිස් තුන හා ක්‍රි.ව. දාහත් වැන්න අතර කාලයේදී නිර්මාණය වී ඇති බවට සාධක මින් ඉස්මතු වේ. මේ කෘති සියල්ල නිර්මාණය කර ඇත්තේ ග්‍රීක හා රෝම අශිෂ්ටාචාරවත් යුගයේ සිට මුඛ පරම්පරාගත ව පැවත එන පුරාණෝක්ති වෘතාන්ත ආශ්‍රය කරගෙනය. නිශ්චිත නිර්මාතෘවරයෙක්, කාලවකවානුවක්, දේශයක් නොමැති

කතාන්දර විශේෂයක් වශයෙන් පුරාණෝක්ති සැලකිල්ලට ගැනේ. (සුදේව, විමලසාර සහ සිරිසුධම්ම, 2020).

පුරාණෝක්ති ආශ්‍රයෙන් නිර්මිත කෘතිවල සඳහන් කතා පුවත් සත්‍ය වුව ද, අසත්‍යවුව ද සාහිත්‍ය කෘතියක අඩංගු විය යුතු සමහර අංග ඉස්මතු වන අවස්ථා ඇත. එම අංග අතුරින් චරිත නිරූපණය, ඕනෑම සාහිත්‍ය කෘතියක ගුණාගුණභාවය තීරණය කළ හැකි අංගයකි. දෘශ්‍යමාන පැතිකඩ සිය කාව්‍යයෙන් ධ්වනිත කිරීමට වඩා මිනිසුන්ගේ සිතුම් පැතුම්, ක්‍රියාකාරකම් තීව්‍ර ආකාරයෙන් ප්‍රබල චරිත නිරූපණයක් ඔස්සේ ඉස්මතු කිරීම අපහසු කාර්යයකි. නමුත් පුරාණෝක්තිවලින් වුව ද ප්‍රබල චරිත නිරූපණ දැකිය හැකි අවස්ථා අප්‍රමාණය.

මෙම අධ්‍යයනයට බඳුන් වන්නේ ඕවිඩ්ගේ "Metamorphoses" කෘතිය ආභාසය කරගනිමින් නිර්මිත අනුවර්තනයක් වන දීගොඩ පියදාසයන්ගේ "යවන පුරාණය" නම් කෘතියෙන් නිරූපණය වන චරිතවල ස්වභාවය අධ්‍යයනය කිරීමයි. ඕවිඩ්ගේ මුල් කෘතිය හා සසඳන විට අනුවාදක දීගොඩ පියදාසගේ කෘතිය වන "යවන පුරාණය" පිළිගත නොහැකි පරිවර්තනයක් වන බව යම් විද්වතුන්ගේ මතයයි. ඒ බව කෘතියෙහි නමින්ම තේරුම්ගත හැකි කරුණකි. යවන පුරාණය යන්න ග්‍රීකයින්ගේ ඉතිහාසය සිහිගන්වන්නා වූ නාමයකි. නමුත් පියදාසයන්ගේ කෘතිය පරිශීලනය කිරීමේ දී හසුවන විශේෂ කරුණක් නම් දේව නාමයන් ග්‍රීක ගණයෙන් නොව රෝම ගණයෙන් ම සඳහන් කිරීමත්, ලිඛිත මූලාශ්‍රය හා අන්තර්ජාල පරිශීලනයට අනුව ඕවිඩ් සිය මුල් කෘතිය ලතින් බසින් රචනා කර ඇති බවත් සොයාගැනීමට හැකිය. පියදාසයන්ගේ කෘතියට සපයා ඇති උපග්‍රන්ථයෙහිත් "යවන පුරාණය" නම් කෘතිය ඕවිඩ්ගේ කෘතියට සැපයූ අනුවර්තනයක් මිස පරිවර්තනයක් නොවන බවට සාධක සඳහන් ව ඇත. ඔහු එම කෘතිය යම් සංශෝධනයන්ට ලක් කර ඇත්තේ මෙරට පාඨක සමාජයට සුදුසු වන පරිදි රචනා කිරීමට ය. එහෙත් දීගොඩ පියදාසයන් ඕවිඩ් හා ඕවිඩ්ගේ කෘතිය පිළිබඳ කිසිඳු අදහසක් නොමැති අයෙකු ලෙස නම් කිරීමට ද නොහැකි බව මෙම කෘතිය මනාව පරිශීලනය කිරීමෙන් තේරුම්ගත හැකිය. කෙසේවෙතත් මෙම අධ්‍යයනයෙහි මූලිකත්වය ගැනෙන්නේ මෙම කෘතිවල නිර්වද්‍ය සාවද්‍යතාවය විමසීමට වඩා රෝම පුරාකතාවලින් ධ්වනිත වන චරිත නිරූපණය පිරික්සීමයි. ඒ සඳහා සිංහලයට අනුවර්තිත රෝම පුරාකතා ඇතුළත් කෘතියක් වශයෙන් "යවන පුරාණය" වැදගත් වන්නකි. එම චරිතවල ස්වභාවය විශ්ලේෂණය කළ හැක්කේ කුමනාකාරයකින් ද? යන්න මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ගැටලුවයි.

ඇරිස්ටෝටල් ඉදිරිපත් කළ මතය වූයේ සෑම ශෝකෝත්පාදකයටම අවශ්‍ය අංග හය (ඇරිස්ටෝටල්, 333/2013) අතර චරිත නිරූපණය දෙවැනි තැන ගන්නා බවයි.

> " ක්‍රියාවෙන් තොරව ශෝකෝත්පාදකයක් සම්පූර්ණ විය නොහැක. අනෙක් අතින් චරිත නිරූපණයෙන් තොරව ශෝකෝත්පාදයක් සම්පූර්ණ විය හැකිය" (ඇරිස්ටෝටල්, 333/2013).

මේ පිළිබඳ ඇරිස්ටෝටල් තවදුරටත් පවසන්නේ චරිත අවශ්‍ය වනුයේ කාව්‍යයක ප්‍රධාන අංගය වන ක්‍රියා සාධනය සපුරා ලීම සඳහා බවයි. මෙම ප්‍රකාශයට අනුව චරිත නිරූපණයෙන් තොරව ශෝකෝත්පාදකයක් සම්පූර්ණ වන්නේ ක්‍රියාව ඔස්සේය. නමුත් චරිත නිරූපණයකින් තොරව නිර්මාණයක ක්‍රියා සාධනය ඉටු නොවේ. ඇරිස්ටෝටල් චරිත නිරූපණය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ විවිධ මත අනුව පුරාකතාවන්හි ඇතුළත් චරිත විශ්ලේෂණය කිරීම වැදගත් ය. එසේම පෙරදිග කාව්‍යමය න්‍යායයන් ඔස්සේ අපරදිග කතාපුවත් විග්‍රහ කිරීමට වඩා අපරදිග කාව්‍යමය න්‍යායන් ප්‍රමුඛකොට ගනිමින් අපරදිග පුරාකතා විමසුමට ලක්කිරීම සුදුසු බව පිළිගත හැකිය.

ග්‍රීක දාර්ශනිකයෙකු වූ ඇරිස්ටෝටල්ගේ "Poetics" නැතහොත් "කාව්‍ය ශාස්ත්‍රය" ආශ්‍රයෙන් හා විසිවන සියවසේ විසූ මනෝ විග්‍රහය නම් චිත්ත විභාග ක්‍රමයෙහි ආදි කතුවරයා වූ සිග්මන් ෆ්‍රොයිඩ්ගේ ගැඹුරු සිද්ධාන්ත අනුව ද එම චරිත විග්‍රහයට බඳුන් කෙරේ. ෆ්‍රොයිඩ්ගේ සිත පිළිබඳ විග්‍රහයට අනුව සිත සාගරයෙහි ගිලී ඇති අයිස් කුට්ටියකට සමාන ය. එමෙන්ම අවස්ථාව ලද සැනින් යටි සිතෙහි තැම්පත් ව ඇති මිනිසාගේ ප්‍රකෘති ස්වභාවය නැත්නම් පරිණාමික යුගයේ සිට පැවත එන තිරිසන් මනෝභාවයන් ඉස්මතු වීම වැළැක්විය නොහැක. ඒවා සම්පූර්ණයෙන් යටපත් කිරීම අපහසු කාර්යයකි. යටි සිත එතරම් පෘථුල වූවක් සහ සංකීර්ණ දත්ත ගබඩාවකි. තිරිසන් මනෝභාවයන් අඩපණ කළ හැක්කේ සුපහන් සිත 'Super Ego' මඟිනි.

අනෙකුත් ග්‍රීක, රෝම මහා කාව්‍යයන් සමඟ සසඳන විට මෙම කෘතියෙහි විශේෂත්වය වන්නේ එක් විශේෂ සිදුවීමක් මූලික කරගත් පුරාණෝක්තියක් ඇසුරෙන් නොව විවිධ පුරාණෝක්ති කතා බොහෝමයක එකතුවක් කතාන්දර කීමේ කලාව යොදාගනිමින් නිර්මාණය කර තිබීමයි. ඕවිඩ්ගේ මුල් කෘතියෙහි පුරාණ කතා 250ක් පමණ ඇතුළත් ව ඇති බවට විද්වත් නිගමනයක් ද වෙයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේ දී මූලික ව අවධානයට යොමුවන්නේ ඕවිඩ්ගේ Metamorphoses කෘතියෙහි සිංහල අනුවර්තනයක් වන දීගොඩ පියදාසයන්ගේ "යවන පුරාණය" නම් කෘතියයි. එමෙන් ම මෙම අධ්‍යයන සඳහා යොදාගන්නා වෙනත් ද්විතීයික මූලාශ්‍රය වන ආරියදාස සෝමතිලකයන්ගේ "සිග්මන් ෆ්‍රොයිඩ් සහ මනෝවිග්‍රහය, ඇමෙරිකානු ජාතික බැරිවෙල්ලි සහ ගිබොල්දි රචිත "*ෂබඑැරරුක්එසදබි දල බසඑැරඑමරු*" යන කෘති හා පී. බී. මීගස්කුඹුරගේ "ජනප්‍රවාද හා පුරාණ කතා" යන ලිපිය ද උපකාර කර ගැනේ. මීට අමතර ව විවිධ විචාර ග්‍රන්ථ, පර්යේෂණාත්මක ලිපි, අන්තර්ජාල ප්‍රකාශන, විශ්වවිද්‍යාල පුස්තකාලය ද භාවිත කෙරේ. අපගේ අධ්‍යයන ක්‍රමවේදය වනුයේ මානවවංශ පර්යේෂණ විධික්‍රමයට අයත් වන ගුණාත්මක අධ්‍යයන ක්‍රමවේදය යි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ඕවිඩ්ගේ "Metamorphoses" නම් කෘතිය පුරාකතාවන් කිහිපයක එකතුවකින් නිර්මාණය කෙරුණු සාහිත්‍ය කෘතියකි. ඒ උදෙසා පියදාසයන් සැපයූ අනුවර්තනයෙහි හුදෙක් මිනිස් දුබලකම් පමණක්ම නොව සමහර දෙවිවරුන් තුළ පවා ඇති ගුඪ ගති ස්වභාවයන් ගම්‍යමාන කිරීමෙහි ලා පසුබට නොවී ඇත. ග්‍රීක දෙවිවරු මෙන්ම රෝම දෙවිවරු ද ස්වභාවධර්මය අලළා මිනිසුන් විසින් ම කරන ලද නිර්මිතයක් ලෙස පුරාකතා රසවින්දනය කිරීමේ දී පැහැදිලි වන කරුණකි. එහෙයින් මිනිස් ගති ස්වභාවයන් දෙවියන් ඔස්සේ ද ඉස්මතු වීම පුදුමයක් නොවේ. ඕවිඩ් ද එසේ දක්වන්නේ මිනිස් ස්වභාවය පිළිබඳ ඔහු තුළ පැවති ගැඹුරු අවබෝධය නිසා බව නිගමනය කළ හැකිය. ඔහු තුළ වූ මෙම අවබෝධය ඔහුගේ Ars Amatoria (ප්‍රේම කලාව හෙවත් Art of love) නම් ග්‍රන්ථයෙන් පැහැදිලි වන බව මහාචාර්ය රොනල්ඩ් සෙත් කළ පරිවර්තනයක දක්වා ඇත. ඔහු තවදුරටත් සිය මතය දක්වා ඇත්තේ මෙසේ ය.

> "ඔහු ඇත්ත වශයෙන් ම බාගවිට තෙමේ ම නොදැනුවත් වන මුත් අතිශය කෞශල්‍යයකින් යුක්ත වූ මනෝ විද්‍යාඥයෙකි. ප්‍රේම කලාව පිළිබඳ ව සිද්ධාන්ත වශයෙනුත්, ව්‍යවහාර වශයෙනුත්, ඔහු නොදන්නා දෙයක් වෙතොත් ඒ දැනගැනීමට වෙහෙසීමට වත් තරම් නොවෙය" (පියදාස, 1959).

ඕවිඩ් පසුකාලීන විචාරකයන් අතර ද ප්‍රශංසනයට ලක්වෙමින් නව අධ්‍යයනයන්ට අභිප්‍රේරණයක් වන අයුරු ඉහතින් හැඟවේ. මෙහි එන සිදුවීම් සියල්ලම පාහේ සත්‍යත්, අසත්‍යත් අතර සට්ටනය වන අවස්ථාය. විශ්වාස කළ නොහැකි සිදුවීම්වලින් ගහණ වුවත්, එය ප්‍රබල චරිත නිරූපණයක් ඉස්මතු වීම කෙරෙහි බාධාවක් නොවේ. යවන පුරාණයෙහි විවිධ මනෝභාවයන්ට අරක්ගත් දෙවිවරු වෙති. ග්‍රීක ජනයා ඊරෝස් ලෙසත්, රෝම ජනයා ක්‍යුපිඩ් ලෙසත් හැඳින්වූයේ ආලයට අධිපති දේවතාවාය. මීට අමතර ව ශෝක, භීති, සන්ත්‍රාස, උන්මාද යන දූතිකාවෝ රාත්‍රියෙහි දරුවන් හැටියට හැඳින්වෙන අතර අනුනට නපුර එළවීමෙහි නිබඳ ව නියැලුණෝ වෙති. ඒ ඒ කණ්ඩායම් විවිධ චිත්ත ස්වභාවයන් මූර්තිමත්කොට දැක්වීමක් ලෙස ඉස්මතු වේ (පියදාස, 1959). මිනිසුන්ගේ අවශ්‍යතාවන් හා විවිධ මනෝභාවයන් දේවතා ස්වරූපයෙන් දක්වා ඇති බව මින් පැහැදිලිය. නමුත් හුදු මනෝභාවයන් ම පමණක් දේවත්වයට ආරෝපණය නොකළ අවස්ථා ද බොහෝය. ඒ අතර සාමාන්‍ය මිනිස් ක්‍රියාකාරකම් ඔස්සේ ජනිත වන ප්‍රබල මනෝභාවයන් ද යවන පුරාණයෙහි දක්නට ලැබේ. එම මනෝභාවයන් වර්තමානයට ද කාලෝචිත වන බව විග්‍රහයට බඳුන් කළ හැකිය.

නාසිසස්ගේ චරිතය ප්‍රබල මනෝභාවයන් ඉස්මතු වන චරිතයකි. නාසිසස් සිය රූපකාය පිළිබඳව දැඩි ආශක්ත බවකින් පසුවූ තරුණයෙකි. ආශාවේ දැඩි බව හේතුවෙන් ඔහුට අත් වූ අවසාන ඉරණම වූයේ මරණයයි. නාසිසස්ගේ රූපකාය නිසා තරුණියන් වශීකෘත වුව ද ඒ පිළිබඳ තැකීමක් ඔහුට නොවීය. දඩ කෙළියෙහි යෙදෙන අතරෙහි විඩාපත් ව පිපාසය නිවා ගැනීමේ අරමුණින් නිසල ජලතලය වෙත පහත්වන නාසිසස් සිය රූපකාය දැකීමෙන් වශීකෘත වන්නේ එම රූපකාය ඔහුගේ බව ද නොදැනය. එම රුවට ආලය කිරීමට පෙළඹෙන ඔහු ජලතලයෙහි මැවුණු සිය ඡායාව ස්පර්ශ කිරීමට, සිපගැනීමට උත්සාහ කළ ද එය ව්‍යර්ථ විය. එබැවින් ඔහු විරහවෙන් වේදනා විඳ එතැනම මියැදේ.

> "ඔහුගේ නෙතින් ගලන කඳුළු වැටී දිය කැළඹෙන්නට පටන් ගත්විට රූ සපුව ද අතුරුදන් වෙයි.... මෙසේ පසුවන නාසිසස් ඉවැසිය නොහැකි තැන උඩුකය වැසුණු වස්ත්‍රය ඉරා විසිකොට, දෝතින් පපු පෙදෙසට ගසාගන්නට විය. ඒ පහර වැදුණු තැන් ලේ තැළී රෝස පැහැගන්නට විය. එය පොකුණෙහි පිළිබිඹුවෙන් දුටු කල්හි, ඔහු ඉවසුම් නැති විය. ගිනග්නෙහි ලූ ඉටි කැටියක් දිය වී යන්නාක් මෙන්,....." (පියදාස, 1959).

සෑම පුද්ගලයෙකුම තම රූපයට ආලය කිරීම සාමාන්‍ය දෙයකි. නමුත් එය නොසන්සිඳෙන ආශාවක් බවට පත්වීම අසාමාන්‍ය දෙයකි. නාසිසස් නම් තරුණයා ද තමාගේ බව නොදැන වුව ද ආලය කළේ තම රූප කායටය. ඔහුගේ මනස රූපයක් නිසාවෙන් හටගත් ආශක්ත බවින් මැඩගැනීමට නොහැකි විය.

එම රුව ලබාගැනීමට නොහැකි වූ කළ දැඩි මානසික පීඩනයකට ලක් වූ අන්දම ඉහත උපුටනයෙන් පැහැදිලිය. මරණයට පත් වන්නේ ද එම මානසික පීඩනයෙහි පැවති උච්ඡත්වය හේතුවෙනි. තමා ඇලුම් කළ යමක් ලබාගැනීමට නොහැකි වූ කල එය අත්හැරීමට සිත එකඟ කරගත යුතුය. ඊට අපොහොසත් වීමත්, තම රූපය කෙරෙහි අසීමිත ලෙස දැඩි අනුරාගයෙන් බැඳීමත් මානසික ව්‍යාධියකට හේතු වන බව මින් තේරුම් ගත හැකිය. ප්‍රොයිඩ්වාදයේදී මෙම මනෝභාවය නාසිසස් සංකීර්ණය (Narcist Complex) නැතහොත් ආත්මරාග සංකීර්ණය ලෙස හඳුන්වයි. නාසිසස් සංකීර්ණය ලෙස මෙම මනෝභාවය හැඳින්වීමට පවා නාසිසස්ගේ මිථ්‍යාකතාව ප්‍රොයිඩ්ට ඉවහල් වූ බව කියැවේ. (සෝමතිලක, 1963). නාසිසස් සිය රූපකාය වෙත දැක්වූයේ ආලයක් නොව දැඩි රාගාන්විත ආශාවකි. එබැවින් ඔහුට එම රුව ස්පර්ශ කිරීමට හා සිපගැනීමට නොහැකි වීමත්, ඔහුගේ කඳුළු බිඳු වැටීමෙන් දියෙහි දිස් වූ රුව වෙනස් වීමේ සිත් වේදනාව දරාගැනීමට නොහැකි වීමත් දැඩි චිත්ත පීඩනයට හේතු විය. වත්මන් සමාජයෙහිත් යථාර්ථය, අනියත බව තේරුම් නොගත් නාසිසස් වැනි බොළඳ, ළාමක තරුණ තරුණියන්ගේ සංකේතාත්මක චරිත ලක්ෂණ මොහුගෙන් විද්‍යමානය.

පුද්ගලයෙකු මෙලොව විඳින ස්නේහය විවිධ නෑකම්, සබඳතා අනුව වෙනස් වේ. මව්පියන්ගෙන් විඳින ආදරය ප්‍රේමවන්තයෙකුගෙන් හෝ ප්‍රේමවන්තියකගෙන් විඳින ප්‍රේමයට බෙහෙවින්ම වෙනස් ය. එමෙන්ම පුත්‍රයෙකු තම මවගෙන් විඳින ස්නේහයට වඩා පෙම්වතියකගෙන් විඳින ප්‍රේමයත්, දියණියක තම පියාගෙන් ලබන ස්නේහයට වඩා පෙම්වතෙකුගෙන් ලබන ප්‍රේමයත් හාත්පසින්ම වෙනස් ය. මෙවැනි සබඳතා සම්මත යැයි සමාජයෙහි ද පිළිගැනේ. නමුත් සම්මත යැයි හැඳින්වෙන සබඳතා අසම්මත වන අවස්ථා වත්මන් සමාජයෙහි ද අසන්නට දකින්නට ලැබෙන අවස්ථා දුලබ ව පවතී. ඉපැරණි රෝම පුරාකතාවන්ගෙන් ද ධ්වනිත වූ එවැනි අවස්ථාවක් පිළිබඳව යවන පුරාණයෙහි සඳහන් වේ. එම සබඳතාවය පියා නොදැනුවත් ව පිය සෙනෙහසට වඩා අසම්මත පෙම්වතෙකුගේ ප්‍රේමයක් දියණියක විසින් බලාපොරොත්තු වීමකි. එහෙත් ඇය පිය ස්නේහයත්, අනුරාගයත් අතර ස්ව ආත්ම සට්ටනයකට ලක්වෙමින් මෙය විවේචනය කිරීමටත්, සාධාරණීකරණය කිරීමටත් පෙළඹෙන්නීය.

> "ඉදින් එය ඇත්තෙන්ම අපරාධයක් නම්, මේ අපරාධයෙන් වළක්වන මෙන් මම දෙවියන්ගේ නාමයෙන්, ප්‍රේමයේ නාමයෙන්, දරුවන් හා දෙගුරුන් අතර පවත්නා සෙනෙහසේ නාමයෙන් කනන්ලව් කරමි. එහෙත් ඇත්ත වශයෙන් ම මෙය අපරාධයක් ද?.... අසකු සිය දියණියක වූ වෙලඹක අඹුකොට ගැනීමේත් කිසිම ලැජ්ජාවක් නැති....එනිසාම සොබාදහමින් කොතෙකුත් අවසර ඇති දෙය, මේ කුඩුකේඩු නීතිරීති වගයක් නිසා තහනම් වෙයි... සිනිරාස් මාගේ ප්‍රේමයට පාත්‍ර විය යුත්තේමය... තී කරනන්ට හදන මේ පටලැවිල්ලේ තරම තිට නොපෙනේද?....තී තිගේ මවගේ සපත්නිය බවට පත්වීමටත්, තිගේ සොයුරාට මෑණියන් වනන්ටත් පතන්නී ද?...." (පියදාස, 1959).

ඇය මානසික ව ස්වයං විවේචනයටත්, ස්වයං සාධාරණීකරණයටත් කරුණු දක්වමින් ඒ අතර සට්ටනයකට ලක් වන ආකාරය මින් ඉස්මතු වේ. ඇය සිය සිතුවිලි හසුරුවන ආකාරය අනුව යම් අවස්ථාවලදී දුරදර්ශී තැනත්තියක් ලෙසත්, යම් අවස්ථාවලදී මුග්ධ තර්ක ඉදිරිපත් කරමින් ආත්මාර්ථකාමී ක්‍රියාපිළිවෙතක් අනුගමනය කරන තැනැත්තියක් ලෙසත් පෙනේ. මෙමඟින් ඉස්මතු වන තවත් විශේෂ කරුණක් වන්නේ සෑම පුද්ගලයෙකු තුළ ම මුග්ධයෙකු මෙන්ම නුවණැත්තෙකු ද සිටින බවයි. එම ස්වභාවය අවස්ථානුකූලව විවිධ ස්වරූපයන් ගන්නා බව මින් ධ්වනිත කෙරේ. බොහෝවිට මුග්ධ බව, ළාමකත්වය, බොළඳ බව, තරහව, වෛරය වැනි මානසික දුර්වලතා ඉස්මතු වන්නේ හැඟීම් පාර්ශවය ඔස්සේ තීරණගැනීමේදී ය. එවිට බුද්ධින්ද්‍රිය යටපත් වේ. සිනිරාස්ගේ දියණිය

වන මයරාගේ සිතුවිලි ද ඒකමතික නොවන්නේ ඇගේ මනස හා බුද්ධිය එකිනෙක ඝට්ටනය වීම හේතුවෙනි. එහෙත් බුද්ධියට වඩා මනස බලවත් බැවින් එය විවේචනයට ලක්කොට ඉන් මිදීමට හැකියාවක් ඇයට නොවීය. ෆ්‍රොයිඩ්ට අනුව නම් Ego නම් විධායක සිත හා Id නම් දළ සිත සමඟ වන ගැටීම මින් නිරූපණය වේ. එමෙන්ම Super Ego නම් සුපහන් සිත මගින් විධායක සිත අවනත කර නොගන්නා අවස්ථාවක් ලෙස ද ෆ්‍රොයිඩ්ගේ මතවාදවලට අනුව විග්‍රහ කළ හැකිය. (සෝමතිලක, 1963). ඇය සිය පියා සමඟ රහසේම අඹු සැමි සබඳතා පැවැත්වීමට පෙළඹෙන්නේ ද එහෙයිනි (පියදාස, 1959).

තම මවට එවැනි පුරුෂයෙකු ස්වාමී වීම මයරාගේ ඊර්ෂ්‍යාවට ද හේතු වූ බව "ඇත්තෙන්ම, එබඳු සැමියෙකු ලත් මාගේ මව නම් හැබෑම පින්වතියක" (පියදාස, 1959) යන ප්‍රකාශයෙන් තහවුරු වේ. මේ තත්ත්වය පිළිබඳ ව ෆ්‍රොයිඩ් සිය මතය මනෝවිද්‍යාත්මකව පැහැදිලි කරයි. "ෆ්‍රොයිඩ් කියාසිටින්නේ දරුවෙකු බිළිඳු අවධියේ දී තම අත් පා සෙලවීමෙන්, මවගේ තන පුඩුවෙන් කිරි බීමෙන්, මළපහ කිරීමෙන් හා ඒවා ඇල්ලීමෙන් යම් ආස්වාදයක් ලබන බවයි. පසුව තමා සමීපයේම සිටින අයෙකුට ආදරය කරයි. අවුරුදු දෙකක් පමණ වූ පිරිමි දරුවන් මව කෙරෙහිත්, ගැහැණු දරුවන් පියා කෙරෙහිත් ආදරයෙන් බැඳේ. මෙහි දී ගැහැණු දරුවා "තාත්තා මගේ " යැයි පවසමින් තම මව කෙරෙහි ඊර්ෂ්‍යාවක් ගොඩනඟාගැනීම ස්වභාවිකය. පිරිමි දරුවන් මව වෙත ආදරයෙන් බැඳේ. පියා දියණියටත්, දියණිය පියාටත් ආදරය කිරීම වියපත් වූ කළ තම පෙම්වතුනට ආදරය පිරිනැමීමේ මූලික පාඩම" (සෝමතිලක, 1963) ලෙස ෆ්‍රොයිඩ් හඳුන්වා ඇත. මයරා සිය පියා වන සිනිරාස් කෙරෙහි ගොඩනඟාගත් සබඳතාවය ඊඩිපස් සංකීර්ණයෙහි (සෝමතිලක, 1963) අනෙක් පැතිකඩක් ලෙස ද හැඳින්විය හැකිය. කුඩා කළ සිට තම පියාගෙන් ලද ස්නේහය වියපත් වූ විට වෙනත් ප්‍රේමයකින් බලාපොරොත්තු වනවාට වඩා තම පියාගෙන්ම බලාපොරොත්තු වීමේ සංකීර්ණ මනෝභාවයක් ලෙස මෙම අවස්ථාව හැඳින්විය හැකිය. තරුණ වියේදී වෙනත් පෙම්වතෙකු ඇයට ප්‍රේම කිරීමෙන් පියාගෙන් ලබන ස්නේහය තරම්ම ස්නේහයක් ඇය වෙත නොලැබේවි යන සංශයක් ඇය තුළ හටගන්නට ඇත. එහෙයින් ඇය අත පතා පැමිණි තරුණයන් ප්‍රතික්ෂේප කරන්නට පෙළඹුණි. ඇය දැඩිව සිය පියාට ආලය කිරීමත්, තම පියා වැනිම ස්වාමියෙකු බලාපොරොත්තු වීමත් හා ඇයට සිය පියාගෙන් මිදීමේ අන් තරුණයෙකුගේ අත පැතීමේ නොහැකියාවත් ඇගේ මානසිකත්වයට හේතු වී ඇති බව ඉහත අවස්ථාවෙන් ධ්වනිතය.

ආලයෙහි විවිධ පැතිකඩයෝ වෙති. පෘථග්ජනයෝ ආලය වෙනුවෙන් ඕනෑම අභියෝගයකට මුහුණදීමට ඉදිරිපත් වෙති. මව, පියා මැරීමට තරම් ම එය තීව්‍ර විය හැකිය. යවන පුරාණයෙහි ද තම පියාගේ ප්‍රතිවාදියෙකු වන අයෙකුට රහසේම පෙම් කළ දියණියක විසින් තම පියා මරණයට පත්කිරීමට දරන වෑයමක් පිළිබඳ ව කතාපුවතක් ඇතුළත් ය. තම පියාගේ රාජධානිය මිනෝස් නම් ප්‍රතිවාදියා වෙත පවරා සටනෙහි ජය ඔහුට අත්කර මිනෝස්ගේ ප්‍රේමය දිනාගැනීම ඇගේ බලාපොරොත්තුව වන්නීය. එහිදී ඇගේ පියා මරණයට පත්වේය යන හැඟීම ඇගේ කනස්සල්ලට ද හේතු නොවීය. සයිලා කුමරිය මිනෝස් රජුගේ සිත තමා වෙත වසඟයට ගැනීමේ මුල් ප්‍රයත්නය වන්නේ තම පියාගේ දම්පැහැති කෙස් රොදක් ඔහු වෙත ගෙනගොස් දීමයි. එම අවස්ථාව ප්‍රේමය හේතුවෙන් තම පියා වෙත ඇති අමානුෂිකත්වය ඉතා ගැඹුරු ලෙස ඉස්මතු කරන්නකි.

> "ප්‍රේමය නිසා මම අපරාධයට පෙළඹුනෙමි. මම, නීයුස් රජුගේ දියණිය වන සයිලා, මාගේ රාජධානිය ඔබ වෙත පවරාදෙන්නෙමි.... මාගේ ප්‍රේමය පිළිබඳ මේ ඇපය, මේ දම්වන් කෙස් රොද පිළිගත මැනවි. ඔව්, මේ මාගේ පියාණන්ගේ කෙස් රොදක් නොව, මෙසේ ඔබට පාවාදෙන්නේ මාගේ පියාගේ හිසම බව සැලකුව මැනවි " (පියදාස, 1959).

ප්‍රේමය වැනි මානව හැඟීමක් හේතුවෙන් ප්‍රතිවාදියෙකු වෙත රාජ්‍ය පවරාදීම වැනි දේශපාලනමය වශයෙන් අවාසිදායක ක්‍රියාවලි සිදුකිරීමෙන් තමාටම අවාසි සහගත තත්ත්වයක් ඉන් උදාවනු ඇත. ඒ පිළිබඳ සිතීමට තරම්වත් ඇය දූරදර්ශී ඥානයක් රහිත බොළඳ, ළාමක තරුණියක් වූවාය. සිය පියා මැරවීමෙන් සමාජයෙන් වන පීඩා මෙන්ම ඇයටම සැඟවිය නොහැකි වරදකාරී හෘද සාක්ෂිය පිළිබඳ බුද්ධියෙන් සිතා කටයුතු කිරීමට තරම්වත් ඇගේ මනස බුද්ධියට නම්‍යශීලී නොවීය. සිතෙහි පවතින ගූඪ ස්වභාවය මින් මනාව ඉස්මතු වේ. ෆ්‍රොයිඩ් මෙවැනි අවස්ථාවන් විශ්ලේෂණයට බඳුන් කරන්නේ Id නම් මනසිකාරය මගින් Super Ego නම් මනසිකාරය පාලනය කරමින් යටි සිතෙහි (Unconscious mind) තැම්පත් ව ඇති විකෘති ආශාවන් උඩු සිත (Conscious mind) ඔස්සේ ක්‍රියාත්මක කරවන අවස්ථාවක් ලෙසය. (සෝමතිලක, 1963). මෙහි දී මිනෝස් නම් ප්‍රතිවාදී චරිතයෙහි පවත්නා ප්‍රබලත්වයක්ද ඉස්මතු වේ. තම ප්‍රතිවාදියාගේ දියණිය ඔස්සේ තම පරමාර්ථය ඉටුකරගැනීමට හැකියාව

තිබියදීත් ඔහු එම ක්‍රියාව ප්‍රතික්ෂේප කරන්නේ දියණියක විසින් සිය පියා වෙත මුදාහරිනු ලබන්නට සූදානම් වන සාහසිකත්වයට තමා ද සහභාගි වුවහොත් එයින් තමාට ද අයහපතක් වන බව සිතූ හෙයිනි. මෙම තත්ත්වය ෆ්‍රොයිඩ්ට අනුව නම් සුපහන් සිත අනෙකුත් සියලු සිතුවිලිවලට වඩා ප්‍රබල ව ඉස්මතු වීමක් ලෙස නිරූපණය වේ (සෝමතිලක, 1963). ඔහුගේ චරිතය ප්‍රතිවාදියෙකු ඉදිරියේ ආක්‍රමණික ස්වරූපයක් ගත්තද, ප්‍රතිවාදියාගේ සබඳතා දඬමීමා කරගනිමින් සිය අරමුණු කුඨ ලෙස ඉටුකරගැනීමට තරම් දුර්ගුණ සහිත පහත් චරිතයක් නොවිය. ඔහු මානව සබඳතා පිළිබඳ සංවේදී අයෙකු වශයෙන් ඒ පිළිබඳ කම්පාවෙමින් පිළිකුල් සහගත ව ප්‍රතික්ෂේප කිරීමට පෙළඹේ. ඔහු සටන අතරමග නවත්වා නැවත තම මාළිගය කරා ගමන් කරන්නේ ද එහෙයිනි (පියදාස, 1959). සයිලා කුමරිය හා මිනෝස් රජු ඔස්සේ මානව සබඳතාවන්හි පවතින ගුඪතා මෙන්ම ප්‍රබලතා ද ඉස්මතු කරලීමට ඕවිඩ් සමතෙකු වූ බව දීගොඩ පියදාසයන්ගේ අනුවර්තිත කෘතියෙන් පැහැදිලිය.

දේශයක ඕනෑම පුද්ගලයෙකුට සිය රුචිකත්වය හා විශ්වාසය මත ඕනෑම ආගමක්, දර්ශනයක් විශ්වාස කිරීමට මෙන්ම ඒවා අවිශ්වාස කිරීමේ අයිතිය ද ඔහු සතු වේ. එහෙත් තර්කානුකූල ව තමා නොපිළිගන්නා විශ්වාස හා ඇදහිලි වෙත අවඥා කිරීම සමාජයීය වශයෙන් අවිචාරවත් වූවකි. එහි ගුණදොස් පෙන්වා දීම කළ යුත්තේ අවඥාවෙන් හෝ කෲරත්වයෙන් බැහැර කිරීමක් ලෙස නොවේ. ඉපැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාරය තුළ ද දේව විශ්වාසයන් අවඥාවෙන් යුතුව බැහැර කළ පුද්ගලයින් සිටි බවට සාධක යවන පුරාණයෙහි එන පෙන්තියුස්ගේ චරිතය මඟින් ධ්වනිත වේ. ඔහු බැකුස් දේව භක්තිකයන් හට හිරිහැර කළ පුද්ගලයෙකි. ඔහුගේ ක්‍රියාකලාපය සදෘෂ්ටිකවාදී ක්‍රියාකලාපයක් ද නොවේ. ඔහු සදෘෂ්ටිකවාදියෙකු වූයේ නම් එම විශ්වාස අවඥාවෙන් බැහැර කිරීම වෙනුවට කරුණු පැහැදිලි කර ස්වමතයකට පැමිණීමේ නිදහස අන් අයට ලබාදේ. එහෙත් මොහුගේ චරිතයෙන් ඉස්මතු වන්නේ දෙවියන් අවඥාවෙන් හා පරිභව කරමින් බැහැර කරන ගති ස්වභාවයන්ය (පියදාස, 1959). එබැවින් මොහු භෞතිකවාදියෙකු ලෙස ද හැඳින්වීමට නොහැකිය. නමුත් අන්තවාදියෙකුගේ ලක්ෂණ පෙන්තියුස්ගේ චරිතය ඔස්සේ ඉස්මතු වේ. සිය මතයට එරෙහිවන්නන් වෙත හිරිහැර පැමිණවීමෙන් තම මතය සපථ කිරීමට උත්සාහ දැරීම ඔවුන්ගේ ලක්ෂණයයි. අවසානයේ අන්තවාදීබව නිසා මොහු මරණයට පත්වන්නේ ද දැඩි මිථ්‍යාදෘෂ්ටිකභාවයෙන් අන්ධ ව සිටි තම මෑණියන්ට ගොදුරුවීමෙනි.

> "අපේ මේ ශුද්ධ භූමිය කැතකරමින් සැරිසරන අර උෟරු තඩියා, මාගේ මේ හෙල්ල පහරට ගොදුරු කළ යුතුයි. ඇ උමතුවෙන් මෙන් කෑගැවාය....ඔහුගේ මව, මහ බිහිසුණු රාවයක් නන්වා අනතුරුව, හිස කෙස් විසිර යන සේ හිස ගස්සාදමා, පැන්න ගමන් ඔහුගේ හිස කඳින් වෙන්කොට දැම්මාය. ඉනික්බිති ලේ වැකුණු ඇඟිලිවලින් පුතුගේ හිස එල්ලාගත් ඈ බලව්, " මාගේ මිත්‍රවරුනි, මාගේ මේ ජයග්‍රහණය බලව් " යයි කෑගාන්නට ද පටන් ගත්තා ය. එපමණකින් නතර නොවුණු ඈ ඔහුගේ අවයව සියල්ල එකින් එක සිය දෑතින්ම උපුටාදැම්මාය " (පියදාස, 1959).

මෙය සමස්ත මව්වරුන්ගේ ස්වභාවය නොවේ. එහෙත් ඕවිඩ් මෙහි දී ඉස්මතු කිරීමට උත්සාහ කරන්නට ඇත්තේ අන්ධානුකරණයෙන් වැළඳගත් දේව භක්තියේ භයංකාරත්වය පිළිබඳව ය. දේව භක්තියේ නාමයෙන් ඕනෑම සැහැසි ක්‍රියාවක් කිරීමට තරම් එම චිත්ත පාර්ශවය බලවත් වේ. ප්‍රලය වන මානසිකත්වයකින් යුතු ඕනෑම අයෙකුට තමා එම අවස්ථාවේ දී කරනු ලබන දෙයෙහි වරද හෝ නිවරද නොතේරේ. අන්ධානුකරණය මුළුමහත් සමාජයක් විපරිණාමයට පත් කරන්නකි. එයින් ම්ලේච්ඡත්වය කරා ද යා හැකිය. සමහර අවස්ථාවල දී ප්‍රබල මානව සබඳතා අන්ධානුකරණය හේතුවෙන් කැඩී බිඳී යාමට ද පුළුවන. උමතුව කෙතරම් ප්‍රබල මානසිකත්වයක් වන්නේ ද යන්න ඉහත අවස්ථාවෙන් පැහැදිලි වේ. එසේම අන්ධානුකරණය හේතුවෙන් පුද්ගලයාගේ විකෘති මානසිකත්වය ප්‍රකෘතිය මර්ධනය කරමින් උත්සන්න වන අයුරු මින් ධ්වනිතය. ෆ්‍රොයිඩ්වාදයට අනුව නම් Id මනසිකාරය, Ego මනසිකාරය අභිභවා යමින් Id මනසිකාරය පාලනයට නතු නොවන අවස්ථාවක් ලෙස නිරූපණය කෙරේ (සෝමතිලක, 1963). ඇරිස්ටෝටල්ට අනුව චරිතයක් ඔස්සේ ඉස්මතු වන කාරුණ්‍යය හා භය ඇතැම් පුද්ගලයන් කෙරෙහි බලපාන ප්‍රබල භාවයන් වේ. යම් දුක්මුසු අවස්ථාවක් ඔස්සේ කාරුණ්‍යය යන භාවය අන්‍යෝන්‍ය සතුරන් අතර ඇතිවන බිහිසුණු ක්‍රියාවකින් ජනිත කළ නොහැක. එම තත්ත්වය ඇති කළ හැක්කේ සතුරු හෝ මිතුරු නොවන මධ්‍යස්ථ පුද්ගලයන් අතර වන ගැටීමක් ඔස්සේය. මවක විසින් තම පුත්‍රයා මරණයට පත් කිරීමෙන් කාරුණ්‍යය ඇති කළ හැකි බව ඇරිස්ටෝටල්ගේ මතයයි (ඇරිස්ටෝටල්, 333/2013). කාරුණ්‍යය නම් භාව ජනිතවන වඩාත්ම උචිත සංසිද්ධියක් ලෙස මෙම අවස්ථාව හැඳින්විය හැකිය.

එක් කුස උපන් සිය නැගණිය හට සිය ස්වාමියාගෙන් සිදු වූ හිරිහැර හේතුවෙන් ඔහුට දාව උපන් සිය පුතු මරණයට පත්කොට ස්වාමියාට පිස ආහාරයට ලබාදුන් අවස්ථාවක් යවන පුරාණයෙහි වෙයි

(පියදාස, 1959). එම ක්‍රියාවලිය ඇගේ මනෝභාවයේ සංකීර්ණත්වය මෙන්ම තම සැමියා පිළිබඳ ව ඇති දැඩි වෛරය හා දරුවා මරණයට පත් කිරීම සඳහා දැක් වූ කෲර උපායශීලී ඥානය ද ධ්වනිත වේ. ස්වාමියා පමණක් නොව ඔහුගේ ලෙයින් උපන් උන් පවා ජීවත් නොවිය යුතු බවට වන වෛරී සිතුවිලි මෙම සැහැසි ක්‍රියාවට ඇයව පොළඹවයි. මනසෙහි වෙළා පවත්නා දුර්වලත්වය පාලනය කිරීමට ස්වයං විනයක් නොමැති වූකල කෙනෙකු සැහැසි වනවා හැර දූරදර්ශී නොවෙයි. වෛරී මනෝභාවයන් බුද්ධිය වසා මනස ඔස්සේ ක්‍රියාත්මක වීම මීට හේතුවයි. ෆ්‍රොයිඩ්ට අනුව දළ සිතෙහි සැඟව පවත්නා පරිණාමය නොවූ තිරිසන් මනෝභාවයන් ඉස්මතු වූ අවස්ථාවකි. එවිට සිතිවිලි ක්‍රියාත්මක වන්නේ ම්ලේච්ඡ ආකාරයෙනි. මනෝභාවයන්හි දුර්වලත්වය ඕවිඩ් අපූර්වාකාරයෙන් ඉස්මතු කරන්නේ මනෝ විශ්ලේෂකයෙකු ලෙසය.

දරු සම්පතින් හා පුද පූජාදියෙන් අහංකාරයට පත් ව සිටි නියෝබා නම් දේවතාවියගේ දරුවන් සහ සැමියා ලිටෝ දේවතාවිය විසින් මරණයට පත් කරනු ලැබූ අවස්ථාවේ නියෝබාගේ මානසිකත්වය ක්‍රියා කළ ආකාරය ප්‍රබල චරිත නිරූපණයක ලක්ෂණ ඉස්මතු කරයි. නියෝබාගේ අහංකාරී සිතුවිලි ඇයව විනාශ මුඛය කරා ගෙනයාමටත්, ලිටෝගේ වෛරයට පාත්‍රවන්නටත් හේතුවිය. දරුවන් හා පුද පූජාදියෙන් ආඪ්‍ය ව සිටින නියෝබා, ලිටෝ වෙත කෙරෙන පූජාදියෙන් ජනයා වැළැක්වූවාය. නියෝබාගේ වදන් කෙරෙහි ලිටෝ තුළ දැඩි ශෝකයක් ද හටගන්නට ඇත (පියදාස, 1959). මේවා ලිටෝගේ වෛරය දැඩිවන්නට හේතු විය. නියෝබාගේ සැමියා ඇතුළු දරුවන් සියළුදෙනා මරණයට පත් කරන්නේ එහෙයිනි. ලිටෝ, තම සැමියා සහ දරුවන් මරණයට පත් කළ අවස්ථාවේ නියෝබාගේ චරිතය සිත් ප්‍රකම්පිත කරවන සුළුය.

> "දැන් ඉතින් මට පත් විපතින්, දුෂ්ට ලිටෝ, තිගේ මනදොළ පුරාගනුව! අහෝ! මාගේ පුතුන් සත්දෙනාගේ මරණයෙන් මම සත්වරක් ජීවිතක්ෂයට පත් වීමි" (පියදාස, 1959).

එම අවස්ථාවෙන් ඇගේ අහංකාරය නොව ඇගේ සිතුවිලිවලින්ම පැනනැගි අදෝනාවක් ඉස්මතු වේ. ඇගේ අහංකාරයත් සමඟ සැඟවුණ දැඩි දාරක ස්නේහයක් මින් ගම්‍ය වේ. එය සතුරන්ගේ පවා දැඩි අනුකම්පාවක් ලද මොහොතකි. ලිටෝ ඉන් තම සතුරුකම නවතාලන්නේද එහෙයිනි. නමුත් නියෝබාගේ අහංකාරය නැවත ඉල්පුණු හෙයින් දියණියන් ද මරා දැමීමට ලිටෝ පෙළඹේ. ඇය ස්වාමියා හා දරුවන් අහිමිව අසරණ ව සිටින අවාසනාවන්ත ගැහැණියක් බවට පත් විය. සියළු තේජසින් ආඪ්‍ය ව සිටි ඇය සියල්ලගෙන්ම ශූන්‍ය ස්ත්‍රියක් බවට පත් වූයේ ක්ෂණයකිනි. ඕවිඩ් මේ චරිතය ඔස්සේ ජීවිතයේ සැබෑ යථාර්ථය, සියල්ල වෙනස්වන සුළු ස්වභාවය හා අනියතභාවය පිළිබඳව ධ්වනිත කිරීමට සමත් වේ. සිතෙහි ගොඩනැගෙන දුර්වලතාවයන් වන අහංකාරය, මමංකාරය, කෝපය, ආත්මාර්ථකාමිත්වය වැනි සිතුවිලි හේතුවෙන් තමාට සැනසීම උදා නොවන බවත්, ඉන් තමාම විනාශ මුඛයට ඇදෙන බවත් යවන පුරාණය ඔස්සේ ආදර්ශ සැපයෙන්නේ ඕවිඩ්ගේ කෘතියෙහි ආභාසයද ස්මෘතියට නන්වමිනි.

ඉලියඩ් හා ඔඩිසි ග්‍රීක පුරාකතා බොහෝදුරට අතිශයෝක්තියෙන් උළුප්පා දක්වන්නේ දෙවියන්ගේ හා යුධ වීරයන්ගේ කාය ප්‍රබලතා පිළිබඳව ය. එහෙත් වර්ජිල් හා ඕවිඩ් මනෝ ප්‍රබලතාවයන්ට මෙන්ම දුබලතාවයන් වෙතටද අවධානය යොමුකර ඇත. එම කෘතිවල දෙවියන් උසස්කොට දැක්වීමක් නොමැත. දෙවියන්ගේ චිත්ත ක්‍රියාකාරිත්වය ද විවිධ සංකීර්ණතා ඔස්සේ නරයන්ගේ මෙන්ම ක්‍රියාත්මක වන අයුරු ධ්වනිත කරලීමට පසුබට වී නැත.

බොහෝදුරට ජුපිටර්ගේ කාමාශක්ත චිත්ත ස්වභාවය, ඔහු හේතුකොටගෙන තරුණියන් කරදරයට පත්වීම, ගැබ්ගැනීම්, එම තරුණියන් ජුපිටර්ගේ භාර්යාව වන ජූනෝගෙන් දඬුවම් ලැබීම් ආදිය සුලබ ව යවන පුරාණයෙහි දක්නට ලැබේ (පියදාස, 1959). ජුපිටර් රූමත් තරුණියන් කෙරෙහි කාමශක්ත වුව ද ඔහුගේ භාර්යාව ජූනෝ, ජුපිටර් කෙරෙහිම පතිභක්තියෙන් යුතු දෙවඟනකි. තම ස්වාමියා අත වරද තිබියදීත් ඇය එම තරුණියන්ට දඬුවම් කිරීමට පෙළඹෙන්නේ තම ස්වාමියා කෙරේ වූ දැඩි ආදරයත්, සපත්නීරෝෂයත්, තම ස්වාමියාගේ වරද ලොවට හෙළිවීමට ඉඩ නොදී ඔහුගේ ගෞරවය ආරක්ෂා කිරීමත් පිණිසය. ජුපිටර්ගේ ප්‍රේමයෙහි වෙනසක් සිදු වීම ඇයට දරාගත නොහැක. ඇය ප්‍රේමය වෙනුවෙන් යුධ වැදෙන්නියකි. ඇගේ ක්‍රෝධයත්, වේදනාවත් අතර පවතින්නේ ඉතාමත් සුළු පරතරයකි. දේවතාවියක වුව ද තම ස්වාමියාගෙන් ආදරය අහිමි වූ පෘථග්ජන මිනිස් ගැහැණියකට ඇය සමානය.

ඉලියඩ්, ඔඩිසි, ඊනිඩ් යන පුරාකතා ත්‍රිත්වයටත් වඩා යවන පුරාණයෙහි එන චරිත ඔස්සේ ස්වාත්මීකාරයකට (ඇරිස්ටෝටල්, 333/2013) සමාන හැඟීමක් පාඨකයා තුළ හටගනී. එය යුද්ධය පිළිබඳව ඇති කතාමාලාවක් නොවීමත්, විවිධාකාර චිත්ත චෛතසිකයන් විවිධ ක්‍රියාකලාපයන් ඔස්සේ

ඉස්මතු කරන කෘතියක් වීමත් මීට හේතුවයි. ඉපැරණි යුගයෙහි පැවති යුධ සංහාරයනට වඩා චිත්ත ස්වභාවයන් ඕනෑම යුගයකට පොදු වන බැවින් අනෙකුත් පුරාකතාවලට වඩා යවන පුරාණය වින්දනාත්මක ශක්තියෙන් ඉහළ බව ප්‍රත්‍යක්ෂ වේ.

> "ඕවිඩ් රාත්‍රී කාමය සාවධාන ලෙස විමසා බැලීය. මනුෂ්‍ය තත්ත්වය අවබෝධ කර දීමෙහිලා ඔහු කළ සේවය මෙය වේ.... ඕවිඩ් ඇලෙක්සැන්ඩ්‍රියානු යුගයේ කවීන් මෙන් මනෝවිද්‍යාත්මක කරුණු තියුණු ලෙස සලකා බැලීය. ඔහු විශේෂයෙන් තැත්කළේ ස්ත්‍රීන්ගේ සිත් ක්‍රියා කරන අයුරු පිළිබිඹු කිරීමට ය. ස්ත්‍රීන්ට සමාජ තත්ත්වයක් ලබාදීමට කැමැත්තක් දැක්වූ ඕවිඩ් ඔවුන්ගේ දෘෂ්ටිකෝණය හඳුනාගත් පළමු වන කවියා වේ" (ග්‍රාන්ට්, 1973).

මයරා කුමරිය, ස්ත්‍රී ප්‍රතිමාවක් වෙත ප්‍රේම කළ පිග්මේලියන්, ජුපිටර්, සයිලා කුමරිය, වීනස් හා මාස්ගේ චරිත වැනි තවත් චරිත ඔස්සේ රාත්‍රි කාමය ඉස්මතු වන ආකාරය, එහි ස්වභාවය මනාව පැහැදිළි වේ. එසේම කාමය යන පටු මනෝභාවයට එහාගිය ප්‍රේමය ධ්වනිත වන චරිත බොහොමයක් ද යවන පුරාණයෙහි වේ. එනම්, තිස්බා හා පිරමුස්, ප්‍රතික්ෂේප කළ ද දැඩි ආලය හේතුවෙන් සියදිවි නසාගත් එෆීස් වැනි බොහෝ චරිත වේ. රෝම මහා කවක් වන වර්ජිල්ගේ ඊනිඩය චරිත නිරූපණය අතින් දෙවැනි වන්නේ යවන පුරාණයට පමණක් බව විද්වත් මතයකි (ග්‍රාන්ට්, 1973). දීගොඩ පියදාසයන්ගේ අනුවර්තිත කෘතියෙහි යම් අඩු පාඩු පැවතියද "Metamorphoses" වැනි උත්කෘෂ්ට කෘතියක් "යවන පුරාණය" ලෙස සිංහලයට අනුවර්තනය කරමින් ශ්‍රී ලාංකේය පාඨක සමාජය වෙනත් දේශයන්හි සාහිත්‍ය කෘති වෙත අවධානය යොමු කරවීමේ ප්‍රයත්නය අගය කළ යුතු කාර්යයකි.

**නිගමනය**

ග්‍රීක නිර්මාණකරුවන්ගෙන් රෝමවරු මූලබීජ සපයාගනිමින් පසුකාලීනව නිර්මාණකරණයේ යෙදුණු රෝම නිර්මාණකරුවෝ ලෙස වර්ජිල් හා ඕවිඩ් (ග්‍රීක සම්භවයක් ඇති නිර්මාණකරුවෙකු ලෙස ද සැලකේ) මූලිකත්වය ගනී. නමුත් ග්‍රීක නිර්මාණවලට සාපේක්ෂ ව මෙහි දී සාකච්ඡාවට බඳුන් කළ රෝම නිර්මාණ ඔස්සේ චරිත කෙරෙහි විශේෂාවධානයක් යොමු කර ඇති අතර එමඟින් යථාර්ථ නිරූපණයක් ඉස්මතු කරයි. ඕවිඩ්ගේ කෘතිය (Metamorphoses) පුරාවටම ප්‍රේමය, විරහව, අසම්මතය මුල් කරගත් සිද්ධීන් සමුදායක් සංකීර්ණ මනෝස්වභාවයන් ලෙස නිරූපණය කර ඇති අවස්ථා විරල ව දැකිය හැකිය. එය මීට ඉහත දී සඳහන් කළ රොනල්ඩ් සෙත් වැනි විචාරකයන්ගේ අදහස් මගින් පෙන්නුම් කෙරේ. ඒ බව යවන පුරාණය නම් අනුවර්තනයෙන්ද පිළිගත හැකි කරුණකි. මීට අමතර ව අන්ධානුකරණය, වෛරය, ම්ලේච්ඡත්වය වැනි විවිධ මනෝ සංකීර්ණතා පිළිබඳව ද ප්‍රබලාකාරයෙන් ධ්වනිත කරයි. මෙම පුරාකතාවන්හි දේව චරිත පැවතිය ද එම චරිත ජීවමානාකාරයෙන් ඉදිරිපත් කිරීමට ඕවිඩ් සමත්ව ඇත්තේ ඔහුට පූර්වකාලීන නිර්මාණකරුවන්ගේ ආභාසය ද කරණකොටගෙන විය හැකිය. ඊ.එම්. ෆෝස්ටර් ප්‍රකාශ කරන්නේ චරිත නිරූපණයෙහි "චරිත සැබෑ පුද්ගලයන් ලෙස පෙනෙනුයේ ඔවුන් අපට සමානකම් දක්වන නිසා නොව ඇදහිය හැකි ආකාරයෙන් පෙනී සිටින නිසාය" (ඇරිස්ටෝටල්, 333/2013) යනුවෙනි. යවන පුරාණයෙහි මිනිස් ක්‍රියාකාරකම් මෙන්ම දේව ක්‍රියාකාරකම් ද ඖචිත්‍ය ගුණයෙන් යුක්තව ඉදිරිපත් කර ඇත්තේ සෑම යුගයකටම ආවේණික, පුද්ගලයින් අත්විඳි සහ අසා ඇති මනෝභාවයන් ලෙසය. යුගානුරූපී ව පුද්ගලයා භෞතිකමය වශයෙන් ගතික වුව ද මනෝභාවය අතින් අතීතයේ පැවති මානසික ස්වභාවයන් වර්තමානයේ ද දක්නට ලැබෙන අවස්ථා නිරූපණය වේ.

පුරාකතාවල චරිත විශ්ලේෂණය කිරීමේ දී සිග්මන් ෆ්‍රොයිඩ් තුන් වැදෑරුම් සිත පිළිබඳ කළ මනෝ විග්‍රහය හා චරිත නිරූපණය පිළිබඳ ව ඇරිස්ටෝටල් ඉදිරිපත් කළ කරුණු සැළකිල්ලට ගැනුණි. එහි දී සිග්මන් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ සමහර විග්‍රහයන් උදෙසා පුරාකතා මූලබීජ වූ බවට සාධක විග්‍රහයට ලක් කෙරිණ. එමෙන්ම ඇරිස්ටෝටල් ඉදිරිපත් කළ සිද්ධාන්තයන් ද ෆ්‍රොයිඩ්ගේ මත හා එකඟ වීමක් සමහර අවස්ථාවලදී දක්නට ලැබේ. ඇරිස්ටෝටල් ඉදිරිපත් කළ සාධක සියල්ලම පාහේ ප්‍රබලාකාර ලෙස තහවුරු කරගැනීමට නොහැකි වුව ද යම් ප්‍රමාණයක කරුණු මේ හා සම්බන්ධ කරගනිමින් චරිත විග්‍රහයට පාත්‍ර විය. නමුත් ඇරිස්ටෝටල්ට හා ෆ්‍රොයිඩ්ට පසුකාලීනව උපන් විද්වතුන් හට ඔවුන්ගේ මත ඉදිරිපත් කිරීමට පුරාකතා පසුබිම් වී ඇත. එහෙයින් වර්තමාන නවකතාවක, කෙටිකතාවක ප්‍රබල චරිත නිරූපණයක් සඳහා උචිත ලාක්ෂණිකමය කරුණු පුරාකතාවන්හි දැකිය නොහැකි වුවද පසුකාලීන සාහිත්‍ය නිර්මාපකයාට මින් විශාල බලපෑමක් සිදු වූ බව ෂේක්ස්පියර්, චෝසර් වැනි කතුවරුන්ගේ කෘති පරිශීලනය කිරීමේ දී පැහැදිලිය. එහෙයින් පුරාකතාවන්හි චරිත ප්‍රබලාකාරයෙන් නිරූපණය කර නොමැත යනුවෙන් හැඳින්වීම නොකළ යුත්තකි. චරිත නිරූපණයක ඉස්මතු විය යුතුය යන ලාක්ෂණික

කරුණු නොහැඳිණු යුගයක නිර්මාණකරුවා ස්ව අත්දැකීම් ඔස්සේ නිර්මාණය රසවත් කිරීමට ගත් වෑයම සුළුපටු කාර්යයක් නොවන බව මින් පැහැදිලි වේ. දීගොඩ පියදාසයන්ගේ අනුවර්තනයේදී ඕවිඩ්ගේ කෘතිය යථා තත්ත්වයෙන් කියවීමේ හැකියාව නොමැති වුවද ඒ පිළිබඳ අදහසක් ගැනීමෙහිලා උපකාරී වන වැදගත් කෘතියක් වශයෙන් සඳහන් කළ හැකිය. එබැවින් යවන පුරාණය නම් කෘතිය බැහැර කළ නොහැකිය. එමෙන්ම පුරාකතා ප්‍රාථමික වූ කතාන්දර විශේෂයක් වශයෙන් හඳුන්වා බැහැර කිරීමට වඩා ඉන් ලබන ආභාසයෙන් සාහිත්‍ය ලෝකයේ නවමු මං අධ්‍යයනය කිරීමට පෙළඹීම සාහිත්‍ය ක්ෂේත්‍රය පුළුල් වීමට ද හේතුවනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


ඇරිස්ටෝටල්, (2013). *කාව්‍ය ශාස්ත්‍රය* (ඒ. වී. සුරවීර, පරි.). සරසවි ප්‍රකාශකයෝ. (ග්‍රීක භාෂිත මුල් කෘතිය රචනා කර ඇත්තේ ක්‍රි.පූ. 330 දීය).

ඕවිඩ් (1959). *Ovid's Metamorphoses : යවන පුරාණය* (ඩී. පියදාස, අනු.). සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. (ලතින් භාෂිත මුල් කෘතිය රචනා කර ඇත්තේ ක්‍රි.ව. 8 දීය).

ග්‍රාන්ට්, එම්. (1973). *රෝමවරුන්ගේ ලෝකය* (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, පරි.). ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණාලය.

සුදේව, ඩී., විමලසාර, පී., සහ සිරිසුධම්ම, ඒ. (සංස්.). (2020). *සම්මානිත මහාචාර්ය පී. බී. මීගස්කුඹුර ලේඛනාවලී.* සී/ස විදර්ශන ප්‍රකාශන.

සේනානායක, ජී. බී. (2009). *සාහිත්‍ය සේසත්.* ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

සෝමතිලක, ඒ. (1963). *සිග්මන් ෆ්‍රොයිඩ් සහ මනෝ විග්‍රහය.* ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Wells, H.G. (Ed.). (1965). *A short history of the world*. Collins Clear-Type press.